# මිළ, වැටුප් හා සේවා නියුක්තිය

## මිළ වෙනස්වීම්

1986 දී පසුගිය වර්ෂයට වඩා මඳක් වැඩි වේගයකින් සිල්ලර මිළ ඉහළ නැඟුණි. පසුගිය වර්ෂයේ සියයට 1.5 සමඟ සැසඳීමේදී 1986 වර්ෂයේදී කොළඹ පාරිභෝගිකයින්ගේ මිළ දර්ශකය සියයට 8 ක වැඩිවීමක් වාර්තා කළේය. මෙයට ප්‍රතිවිරුද්ධව යමින් තොග අලෙවි මිළ දර්ශකයෙන් මනිනු ලබන පරිදි නිෂ්පාදන මිළ සියයට 2.9 කින් පහත වැටුණු අතර 1985 වර්ෂයේදී ද නිෂ්පාදන මිළ සියයට 15.2 කින් පහත වැටුණි.

1986 පාරිභෝගික මිළෙහි තියුණු වැඩිවීම් සඳහා කරුණු කීපයක් දායක විය. ආහාර නිෂ්පාදනය කෙරෙහි අහිතකර ලෙස බලපෑ අසතුටුදායක කාලගුණික තත්ත්වයන්ද, කඳුරට ප්‍රදේශයන්හි ප්‍රවාහන පහසුකම් අඩාලවීම හා පොල් සහ පොල් නිෂ්පාදනයන්ගේ මිළ අඩුවීමේ ප්‍රවනතාවය ආපසු හැරීමද මේවායින් වැදගත් කරුණු කීපයකි. මෙයට අමතරව 1985 නොවැම්බර් මාසයේදී හඳුන්වා දුන් වී සඳහා වූ ඉහළ සහතික මිළ, ආනයනික රෙදිපිළි සඳහා බදු රැස් කිරීම, දුම්කොළ සහ මත්පැන් බදු වැඩි කිරීම හා ඉහළ තැපැල් ගාස්තු වැනි අයවැය ඇස්තමේන්තු ගත කරුණුවල පූර්ණ බලපෑමද 1986 වර්ෂයෙහි පිළිබිඹු විය. කෙසේ වෙතත් වර්ෂය තුළ වූ ඉන්ධන සහ බලය සම්බන්ධිත මිළෙහි ස්ථාවරත්වය, උද්ධමනය දරා ගැනීමෙහිලා සෑහෙන දුරකට උපකාරී විය. තවද, 1985 වර්ෂයේ පටන් ගෙන 1986 වර්ෂයේද දිගටම ක්‍රියාත්මක වූ ණය සීමා කිරීමේ ප්‍රතිපත්තීන්ද, අතිරික්ත ද්‍රවශීලිතාව උකහා ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද විවට වෙළෙඳපොළේ කටයුතු ද, සමස්ත ඉල්ලුම පාලනය කිරීමෙහිලා උපකාරීවීම මගින් වෙළෙඳපොළේ මිළ පහත හෙළීමට සැළකිය යුතු ප්‍රමාණයකින් දායක වූවා විය හැකිය.

## පාරිභෝගික මිළ

පසුගිය වර්ෂයේ ඉතාම මධ්‍යස්ථ වූ සියයට 1.5 ක වැඩිවීම හා සසඳන විට 1986 දී කොළඹ පාරිභෝගිකයින්ගේ මිළ දර්ශකය සියයට 8 කින් ඉහළ නැඟුණි. කෙසේ වෙතත් 1978/1984 කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ ද්විසංඛ්‍යා ප්‍රමාණයන්ට වඩා 1986 වර්ෂයේ මිළ වැඩිවීම් සැළකිය යුතු ලෙස අඩුවී ඇත. සම අවස්ථා දෙකක්, එනම් 1986 දෙසැම්බර් 1985 දෙසැම්බර් සමඟ සලකා බැලීමේදී වැඩිවීමේ ප්‍රමාණය සියයට 9 කි. පසුගිය අවුරුද්දේ අදාළ වැඩිවීම සියයට 1.5 කි.

මාස බොහෝ ගණනක් මුළුල්ලේ දර්ශකය පහත වැටුණු පසුගිය අවුරුද්දේ මෙන් නොව, ජූනි මාසයට වඩා සියයට 1.2 කින් දර්ශකය පහත වැටුණු ජූලි මාසයේ හැර, 1986 වර්ෂය පුරාම මිළ නොකඩවා ඉහළ නැඟුණි. 1985 වර්ෂයේ හතර වැනි කාර්තුවේ අවසානයෙහි තිබූ මට්ටමට වඩා වර්ෂයේ පළමු කාර්තුව තුළ සියයට 4.8 කින් මිළ ඉහළ ගියේය. ඒ ඒ කාර්තුවලට පෙර කාර්තුව හා සැසඳීමේදී දෙවැනි, තෙවැනි හා හතර වැනි කාර්තුවල අදාළ වැඩිවීම් පිළිවෙළින් සියයට 1.8, සියයට 1.2 හා සියයට 2.1 ක් විය.

නැඟී යන ආහාර මිළ කොළඹ පාරිභෝගිකයින්ගේ දර්ශකය ඉහළ යෑමට දායක වූ ප්‍රධාන හේතුවකි. පසුගිය වර්ෂයේ සියයට 0.1 ට වඩා අඩු ප්‍රමාණයකින් වර්ධනය වූ ආහාර උප දර්ශකය (බර 61.9%) මේ වර්ෂයේදී සියයට 7.2 කින් ඉහළ නැග ඇත. ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශ බොහොමයක තිබූ නියඟ තත්ත්වයන්ගේ හා 1985 වර්ෂයේ නොවැම්බර් වලදී වී වල සහතික මිළ වැඩිවීමේ ප්‍රතිඵලය වූයේ 1986 වර්ෂයේ වැඩි කාලයක් තුළ සහල් මිළ අධිකව පැවතීමයි. ලෝක වෙළෙඳපොළෙන් ඇති වූ විශාල ඉල්ලුම නිසා අවුරුද්දේ අවසාන මාස කීපය තුළ පොල් මිළ වැඩිවිය. මාළු සහ මස්වල අධික මිළ ද ආහාර උප දර්ශකයේ නැගීමට හේතුවකි. උතුරු සහ නැගෙනහිර ප්‍රදේශයන්හි තිබූ කලබලකාරී තත්ත්වයන් විශේෂයෙන්ම මාළු සැපයුම කෙරෙහි අයහපත් අන්දමින් බලපෑවේය.

රෙදිපිළි වල ඉහළ මිළ ද කොළඹ පාරිභෝගිකයින්ගේ මිළ දර්ශකය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළේය. පසුගිය අවුරුද්දේ සියයට 5.4 කින් ඉහළ නැගුණු රෙදිපිළි සඳහා වූ උප දර්ශකය (බර සියයට 9.4) 1986 වර්ෂයේ දී සියයට 15.5 කින් ඉහළ නැඟුණි. 1986 වර්ෂයේ නොවැම්බර් මාසයේදී ආනයනික රෙදිපිළි මත පනවන ලද සියයට 100 ක බද්ද මේ සඳහා දායක වූ ප්‍රධාන සාධකයකි.

පසුගිය අවුරුද්දේ සියයට 5.5 හා සැසඳීමේදී 1986 වර්ෂයේ නොවැම්බර් මාසයේ දී මත්පැන් සහ සිගරට් මිළ සංශෝධනය කිරීමත් සමඟම විවිධ කාණ්ඩය සඳහා වූ උප දර්ශකය ද සියයට 14.4 කින් ඉහළ නැඟුණි.

ආංශික වශයෙන් සලකා බැලීමේදී දේශීය ගණයේ මිළ ගණන් සියයට 12.2 කින් ඉහළ ගිය අතර පසුගිය අවුරුද්දේ එය සියයට 6.8 ක් විය. පසුගිය අවුරුද්දේ සියයට 3.2 කින් ඉහළ නැඟුණු ආනයන උප දර්ශකය මේ වර්ෂයේ දී සියයට 6.8 කින් ඉහළ ගියේය. 1985 වර්ෂයේ දී සියයට 31.8 කින් පහත වැටුණු අපනයන මිළ ගණන් 1986 දී සියයට 24.1 කින් පහත වැටුණි. අපනයන කාණ්ඩයේ මිළ, වර්ෂයේ පළමු කාර්තු තුන තුළ පහත වැටුණු අතර හතර වන කාර්තුවේදී තියුණු ලෙස ඉහළ නැඟුණි.

### තොග අලෙවි මිළ

තොග අලෙවි මිළ දර්ශකය මගින් භාණ්ඩයන්හි මිළ ඒවායේ මූලික අලෙවි අවස්ථාවේදී මනිනු ලබයි. කෙසේ වෙතත් තොග අලෙවි මිළ දර්ශකයට අයත් ප්‍රධාන අපනයන ද්‍රව්‍යයන්ගේ අධික බර තැබුම නිසා එම ද්‍රව්‍යයන්ගේ මිළ උච්චාවචනය දර්ශකයේ හැසිරීම පාලනය කිරීමෙහිලා යොමුවෙයි. 1985 වර්ෂයේ වාර්තා වූ වඩාත් තියුණු පසු බැසීමක් සේ සැළකිය හැකි සියයට 15.2 හා සැසඳීමේදී 1986 වර්ෂයේ දී තොග අලෙවි මිළ දර්ශකය සියයට 2.9 කින් පහත වැටුණි. කෙසේ වෙතත් සම අවස්ථා දෙකක් ගෙන බැලීමේදී (1986 දෙසැම්බර් 1985 දෙසැම්බර් සමඟ) 1986 වර්ෂය අවසානයේ සිදු වූ අපනයන කාණ්ඩයේ අයිතමයන්ගේ නැඟීම පිළිබිඹු කරමින් දර්ශකය සියයට 12.7 කින් වැඩිවිය. පසුගිය අවුරුද්දේ අදාල වෙනස සියයට 18.2 ක අඩුවීමකි. පෙබරවාරි සිට මැයි දක්වා දර්ශකයේ අඛණ්ඩ පසු බැසීමේ ස්වභාවයක් දක්නට ලැබුණ ද, මෙම පිළිවෙල ජූනි සිට අගෝස්තු කාලය තුළ දී ආපසු හැරුණි. සැප්තැම්බර් මාසයේ දී දර්ශකය නැවත වරක් පහත වැටුණු නමුදු වර්ෂයේ අවසාන මාස තුන තුළ එහි තියුණු ඉහළ යෑමේ ස්වභාවයක් දක්නට ලැබුණි.


ද්‍රව්‍ය වශයෙන් සලකා බැලීමේදී ආහාර සඳහා වූ උප දර්ශකය සියයට 6.6 කින් පහත වැටුණි. පසුගිය අවුරුද්දේ මිළ ඉහළ ගොස් තිබූ කඩදාසි නිෂ්පාදන, රසායන සහ රසායනික නිෂ්පාදන සහ ලෝහමය නිෂ්පාදනවල මිළ 1986 දී පහත වැටුණි. මද්‍ය පාන, රෙදිපිළි හා පාවහන්, යන්ත්‍රෝපකරණ, ඉන්ධන හා ආලෝකය සහ විවිධ අයිතමයන්ගේ මිළ ඉහළ නැඟුණු අතර, ප්‍රවාහන උපකරණ සහ විදුලි උපකරණ මිළ ද ආන්තික වශයෙන් වැඩිවුණි. ඛණිජ තෙල් නිෂ්පාදන සඳහා වූ උප දර්ශකය 1984 සිට නොවෙනස්ව පැවතුණි.

ආංශික වශයෙන් සලකා බැලීමේදී දේශීය අයිතමයන්ගේ මිළ පසුගිය වර්ෂය හා සැසඳිය හැකි අයුරින් ඉහළ ගියේය. එසේ වුවද 1986 දී ආනයන මිළ පහත වැටුණි. පසුගිය වර්ෂයේ වූ සියයට 38.7 තරම් කැපී පෙනෙන සුළු නොවූවද, අපනයන මිළ සියයට 17.8 කින් පහත වැටුණි. අපනයන උප දර්ශකයේ හැසිරීමෙහි සඳහන් කළ යුතු ලක්ෂණයක් වූයේ වර්ෂයේ හතරවන කාර්තුවෙහි ප්‍රදර්ශණය කරන ලද තියුණු නැග්මයි. මෙය පොල් සහ පොල් නිෂ්පාදනයන්ගේ අපනයන මිළෙහි තියුණු වැඩිවීමේ හා තේ මිළෙහි වූ සැළකිය යුතු වර්ධනයේත් ප්‍රතිඵලයකි.

## තොග අලෙවි මිල දර්ශකය

1974=100

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

## වැටුප්

1986 වර්ෂයේ වැටුප් ක්ෂේත්‍රයෙහි ප්‍රධාන වර්ධනයක් වූයේ පාසැල් ගුරුවරුන්ගේ හැර සංවිධානය වූ අංශයේ සෙසු සියළුම රජයේ සේවකයන්ගේ වැටුප් නැවත ව්‍යුහගත කිරීමයි.[1] මෙම ව්‍යුහගත කිරීමේ අරමුණ වූයේ, විධිමත් කළයුතු අක්‍රමවත් බවක් යැයි දැකිය හැකි, සේවකයන් සිය වැටුප් මට්ටම් හි උපරිමයෙහි රැඳී සිටීම වැළැක්වීමයි. කලින් පැවති වැටුප් පරිමාණයන්ගේ සංඛ්‍යාව අඩුවීම නව ව්‍යුහගත කිරීමේ ඇතුළත් කැපී පෙනෙන ලක්ෂණයකි. එකිනෙක වැටුප් පරිමාණයන්ට අදාළ දහ අටක් වූ වැටුප් වර්ධක තලයන් කාණ්ඩ තුනකින් දැන් ක්‍රියාත්මක වේ. නව වැටුප් පරිමාණයන් ක්‍රියාත්මක වීමත් සමඟම නව වැටුප් පරිමාණයන්ගේ ආරම්භක වැටුපට සමාන ආරම්භක වැටුපක් ඇති සියළු නිලධාරීන්ට අතිරේක වැටුප් වර්ධකයක් ප්‍රදානය කරන ලදී. මෙයට අමතරව වැටුප් පරිමාණයන්හි උපරිමයේ රැඳී සිටි සෑම වර්ෂ දෙකක කාලයක් සඳහාම එක් වැටුප් වර්ධකයක් බැගින් ප්‍රදානය කරන ලදී. රජයේ සේවකයන්ට ගෙවනු ලැබූ ජීවන වියදම් දීමනාව 1985 ජනවාරි මට්ටමේ වූ රු. 504 සීමාවේම පැවතිනි. 1985 සිට රජයේ පාසැල් ගුරුවරුන්ගේ වැටුප් මට්ටම නොවෙනස්ව පැවතින.

**1 . 27 සංඛ්‍යා සටහන**

**පඩි පාලක සභා කර්මාන්තයන්හි නියුතු කම්කරුවන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශක ***

| කාණ්ඩය | මූල්‍ය වැටුප් | | | මූර්ත වැටුප් | | |
|---|---|---|---|---|---|---|
| | 1985 | 1986 | ප්‍රතිශත වෙනස | 1985 | 1986 | ප්‍රතිශත වෙනස |
| සමස්ත දර්ශකය .. | 247·9 | 261·3 | 5·4 | 105·7 | 103·2 | -2·4 |
| උප බෙදීම්: | | | | | | |
| i. කෘෂිකර්මයෙහි යෙදී සිටින කම්කරුවන් .. | 273·5 | 288.1 | 5·3 | 116·6 | 113·8 | -2·4 |
| ii. කර්මාන්ත හා වාණිජ කටයුතු වල යෙදී සිටින කම්කරුවන් .. | 203·9 | 224·3 | 10·0 | 87·0 | 88·6 | 1·8 |
| iii. සේවා අංශයේ කම්කරුවන් .. | 190·7 | 190·7 | — | 81·3 | 75·3 | -7·4 |

මූලයන් : කම්කරු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව.

* බොහෝ කර්මාන්තයන්හි පඩිපාලක සභා දැන් මාසික වේතන පමණක් නියම කරන හෙයින් 1984 සිට දර්ශක, මාසික වේතන මත සංශෝධනය කර ඇත.


ඔවුන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශක මගින් මනිනු ලබන පරිදි පඩි පාලක සභා මගින් ආවරණය වූ සංවිධානය වූ පෞද්ගලික අංශයට අයත් සියළුම සේවකයින්ගේ මූල්‍ය වැටුප් 1986 දී සියයට 5.4 කින් වැඩිවිය. පසුගිය අවුරුද්දේ මෙම වැඩිවීම සියයට 8.3 ක් විය. කෙසේ වෙතත් 1986 දී මූර්ත වැටුප් සියයට 2.4 කින් අඩුවිය. කෘෂිකර්ම අංශයේ කම්කරුවන්ට සියයට 5.3 ක වැටුප් වැඩිවීමක් ලැබුණු අතර ඔවුන්ගේ මූර්ත වැටුප් සියයට 2.4 කින් පහත වැටුණි. පසුගිය අවුරුද්දේ සියයට 11.2 ක් වූ වර්ධනය හා සැසඳීමේදී කර්මාන්ත හා වාණිජ කටයුතුවල නියුක්ත කම්කරුවන්ගේ වැටුප් සියයට 10.0 කින් ඉහළ නැඟුණි. මෙම කාණ්ඩයේ සේවකයින්ගේ මූර්ත වැටුප් සියයට 1.8 කින් වර්ධනය විය. සේවා අංශයේ කම්කරුවන්ගේ 1984 සිට නොවෙනස්ව පැවති මූල්‍ය වැටුප්වල වෙනසක් නොවුණ අතර මූර්ත වැටුප් සියයට 7.4 කින් අඩුවිය.

1. රජයේ සේවකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකයන් 1986 ජනවාරි මාසය පදනම් කරගෙන සංශෝධනය කර ඇත. සංශෝධිත දත්තයන් පරිශිෂ්ට සංඛ්‍යා සටහන් අංක 17 හි දැක්වේ. මෙයට අදාල විස්තර සටහනක් 1987 පෙබරවාරි මාසයේ ශ්‍රී ලංකා මහ බැංකු මාසික විවරණිකාවේ පළ වේ.

# වැටුප් ප්‍රමාණ දර්ශක අංක

1978 දෙසැම්බර් = 100

ත්‍රෛමාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

## සේවා නියුක්තිය

මූලික දත්ත අනුව බලනවිට 1986 වසරේදී රාජ්‍ය අංශයෙහි සේවා නියුක්තිය වැඩිවී තිබෙන අතර, අර්ධ රාජ්‍ය අංශයෙහි එය පහත වැටී තිබෙන බව පෙනේ. මෙය 1985 දී පැවති තත්ත්වයට සමාන වූවකි. පෞද්ගලික අංශයෙහි සේවා නියුක්තියද 1986 වර්ෂයේදී වැඩි වූ බවට සලකුනු දක්නට ඇත.

1985 දී සියයට 1.5 කින් වර්ධනය වී තිබුණ රාජ්‍ය අංශයෙහි සේවා නියුක්තිය 1986 දී සියයට 2.0 කින් වැඩි වූ බව තාවකාලික දත්ත වලින් පැහැදිලි වෙයි. සේවා නියුක්තියෙහි සැළකිය යුතු වැඩිවීමක් දක්නට ලැබෙන්නේ අධ්‍යාපන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය කටයුතු, ආරක්ෂක සේවා, රාජ්‍ය පරිපාලන සහ සමාජ සේවා යන ක්ෂේත්‍රයන්හි ය. ඒ අතර ග්‍රාමීය සංවර්ධන හා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවල සේවා නියුක්තියෙහි අඩුවීමක් දක්නට ලැබේ.

අර්ධ රාජ්‍ය අංශයෙහි සේවා නියුක්තිය අඩුවීමේ ප්‍රවනතාවය 1986 වසර තුළදීද විය. 1985 දී සියයට 2.4 අඩුවීම හා සසඳා බලන විට 1986 දී මෙම අංශයේ සේවා නියුක්තිය සියයට 7.0 කින් පමණ පහත වැටීමක් පෙන්නුම් කරයි. ඉංජිනේරු, මගී ප්‍රවාහණය, රෙදි විවීම සහ වානේ, ඛණිජ වැලි හා සිමෙන්ති නිෂ්පාදනයන් හා සම්බන්ධිත අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවා නියුක්තියෙහි අඩුවීමක් දක්නට ඇත. මේ හැර රාජ්‍ය වැවිලි අංශයේ සේවා නියුක්තිය සියයට 9 ක් පමණ අඩුවී ඇති අතර ගංගා නිම්න සංවර්ධන, වරාය සේවාවන්, රූපවාහිනී හා පොදු පහසුකම් සැපයීම ආදියට අදළ ආයතනයන්හි සේවා නියුක්තියෙහි වැඩිවීමක් සිදුවී ඇත.

පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය පිළිබඳ වාර්ෂික දත්ත ඉතා සීමිතය. එමෙන්ම 1986 වසර සඳහා සේවක අර්ථසාධක අරමුදලේ වාර්තා මත පදනම් වූ දත්ත ද අංග සම්පූර්ණ නොවේ. එබැවින් පෞද්ගලික අංශයේ සේවා නියුක්තියෙහි සාමාන්‍ය ප්‍රවනතා තක්සේරු කිරීම සඳහා වෙනත් දර්ශක ප්‍රයෝජනයට ගැනීමේ අවශ්‍යතා මතුවේ. ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පවත්වන ලද ව්‍යාපාර කටයුතු හා සැලසුම් කළ ආයෝජන පිළිබඳ සමීක්ෂණය පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය පිළිබඳව ඇස්තමේන්තු කිරීමට උපයෝගී කර ගන්නා එක් දර්ශකයක් වෙයි. මෙම සමීක්ෂණයේ තොරතුරු අනුව සලකා බලන විට පෞද්ගලික අංශයේ සමාගම්හි සේවා නියුක්තිය, 1984/85 මුදල් වර්ෂයට සාපේක්ෂව, 1985/86 මුදල් වර්ෂය තුළදී සියයට 15.0 කින් වැඩි වී ඇත. 1986/87 මුදල් වර්ෂයේදී එම සමාගම්වල රැකියා නියුක්තිය සියයට 14.0 කින් පමණ වැඩිවීමක් බලාපොරොත්තු වන බව එම තොරතුරු අනුව තවදුරටත් හෙළි වෙයි.

'මහ කොළඹ ආර්ථික කොමිසම' යටතේ ඇති ව්‍යවසායන් මගින් 1986 වර්ෂයේ අවසානය දක්වා පුද්ගලයින් 45,047 කට රැකියා සපයා ඇත. 1985 අවසානය වනවිට රැකියා සපයා තිබුණේ පුද්ගලයින් 35,786 කට පමණි. ඒ අනුව මෙම අංශයෙහි පුද්ගලයන් 9,261ක හෙවත් සියයට 26.0 ක වැඩිවීමක් වාර්තා වෙයි. මීට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ වාණිජමය හා අත්හද බැලීමේ නිෂ්පාදන කටයුතුවල නියැලී තිබූ නිෂ්පාදන ඒකක ගණන 14 කින් වැඩිවීමයි. 1986 වසර අවසාන වනවිට ක්‍රියාත්මකව පැවති නිෂ්පාදන ඒකක 95 න් සියයට 40.0 ක් පමණ රෙදිපිළි, ඇඟලුම් හා සම් භාණ්ඩ නිෂ්පාදන ගණයට වැටේ.

'විදේශීය ආයෝජන උපදේශක කමිටුව' විසින් අනුමත කරන ලද ව්‍යාපෘතීන් මගින් අපේක්ෂිත රැකියා සැපයීම 1985 දී 4,339 සිට 1986 දී 6,854 දක්වා වැඩි වී ඇත. මෙයට අමතරව මෙම කමිටුව මගින් අනුමත කරන ලද ඒකක ගණන 1986 දී සියයට 48.0 ක වැඩිවීමක් පෙන්වයි. 'දේශීය ආයෝජන උපදේශක සභාව' විසින්ද මෙම වසර තුළදී අනුමත කරන ලද ව්‍යාපෘතීන් මගින් අපේක්ෂිත රැකියා සැපයීම 9,659 කින් වැඩිවේ යැයි ඇස්තමේන්තු කර ඇත. ජාතික ආදායම් ඇස්තමේන්තු වලට අනුව පසුගිය වසර හා සසඳා බලන කළ 1986 දී ද්විතියික හා තෘතීයික අංශයන්හි එකතු කළ වටිනාකම වැඩිවීම තුළින්ද එකී අංශයන්හි රැකියා අවස්ථා වැඩිවී යයි කිව හැක.